## ජාතික අධ්‍යාපන ආයතනය - 2014

ජාතික අධ්‍යාපන ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතේ 19 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තුමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ප්‍රකාරව මුදල් ගලායෑම හා ගලාඒම පිළිබිඹු වන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කළ යුතු නමුත් ආයතනය වෙත රාජ්‍ය ප්‍රදාන යටතේ මූල්‍ය නොවන වත්කමක් ලෙස ලැබුණු රු. 8,500,000 ක්වූ වාහනයේ වටිනාකම මුදල් ප්‍රවාහයක් ලෙස සලකා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 09 හි 15 වගන්තිය ප්‍රකාරව තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ගණනය කළ යුතු වුවත් ආයතනයේ අලෙවියට තබා ඇති රු.21,227,878 ක ප්‍රකාශන තොගය තුල රු. 3,537,939 ක ලාභ ආන්තිකයක් ඇතුළත් වීම හේතුවෙන් තොගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය හෝ අලාභය වර්ෂයේ ලාභයට ගැලපිය යුතු වුවද ආයතනය විසින් ඉකුත් වර්ෂවල ස්ථාවර වත්කම් අපහරණය තුලින් ඇති වූ ලාභාලාභ අපහරණ ලාභ අරමුදලකට ගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට එහි ශේෂය රු. 3,640,844 ක් වී තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ඇනවුම් නිකුත් කිරීම පමණක් සිදුකර තිබූ රු.31,569,002 ක්වූ භාණ්ඩවල පිරිවැය උපචිත වියදම් හා මාර්ගස්ථ තොගය යටතේ ගිණුම් ගතකර තිබුණි.

#### 2.2.4 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් ස්ථාවර වත්කම් ගිණුම් 04 ක ශේෂ අදාළ උපලේඛන සමඟ සැසඳීමේදී රු.5,390,441 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ආයතනයේ ණයගැති ශේෂ තුළ වසර 06 කට අධික කාලයක සිට පැවත එන ණය ශේෂ 05 ක එකතුව රු.3,747,754 ක් විය. මේ සඳහා ප්‍රමාණවත් අඩමාණ ණය වෙන් කිරීමක් සිදුකර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 | (i) තත්කාර්ය අතුරු අග්‍රිම එය දෙන ලද කාර්යය අවසන් වූ විගසම පියවිය යුතු වුවද ජාතික අධ්‍යාපන ආයතනය විසින් නිලධාරීන් 17 දෙනෙකුට ලබාදී තිබූ එකතුව රු.649,150 ක්වූ තත්කාර්යය අතුරු අග්‍රිම පියවීම මාස 01 සිට මාස 10 දක්වා ප්‍රමාද කර තිබුණි. |
| | | (ii) තත්කාර්ය අතුරු අග්‍රිම ලබාගත හැක්කේ රු. 20,000 ක සීමාව තුල වුවත් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ආයතනය විසින් එම සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබූ අතර විවිධ වැඩසටහන් 32 ක් සඳහා අග්‍රිම ලබාදීමේදී සියයට 50 සිට සියයට 100 දක්වා වූ අධි ඇස්තමේන්තු මත එකතුව රු.1,178,750 ක අත්තිකාරම් ලබාදී තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>(i) IV පරිච්ඡේදයේ 3.3 වගන්තිය | ස්ථිර සේවක සංඛ්‍යාවෙහි පුරප්පාඩුවක් ස්ථිර පදනම මත පුරවන තෙක් අනියම් නිලධාරියෙකු එකී තනතුරට බඳවා නොගත යුතු වුවද එයට පටහැනිව හා විධිමත් පරිදි පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ආයතනයේ පුරප්පාඩු සඳහා කැලි පදනම හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සිටි නිලධාරීන් 28 දෙනෙකුගේ සේවය 2013 වර්ෂයේ සිට සේවය ස්ථිර කර තිබුණි. |
| | (ii) IV පරිච්ඡේදයේ 3.3 වගන්තිය | බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව සේවා පලපුරුද්ද නොතිබෙන අයෙකු 2012 පෙබරවාරි 21 දින පුහුණු පදනම මත සේවයට බඳවා ගෙන පසුව 2013 දෙසැම්බර් 07 දින සිට කොන්ත්‍රාත් පදනමට ආයතනයේ පරිපාලන නිලධාරී ලෙස පත් කර තිබුණි. මාස 09 ක් ගතවීමෙන් පසු තනතුරට අදාල නිත්‍ය බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් 2014 සැප්තැම්බර් 02 දින පළකරන ලද අතර තනතුර සඳහා ඉතා ඉහළ සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත්‍ර ලැබී තිබියදීත් විධිමත් බඳවා ගැනීමක් සිදු කිරීම ආයතනය විසින් පැහැර හැර ඇති බව නිරීක්ෂණය විය. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයේදී ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.59,317,999 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 36,496,150 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.22,821,849 ක වාසිදායක තත්ත්වයක් පෙන්නුම් කරන අතර මෙම විචලනයට දේශීය තැන්පතු ආදායම් රු.117,128,348 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 ආයතනය විසින් හා ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතව ගිවිසුම් කඩ කරන ලද නිලධාරීන් 06 දෙනෙකුට එරෙහිව එකතුව රු.12,215,387 ක් වන්දි ඉල්ලා අධිකරණ වල නඩු 06 ක් ගොනුකර තිබුණු අතර ඉන් එක් නඩු තීන්දුවකට පසුව රු.14,604 බැගින් වටිනාකම රු.876,236 ක් වාරික 60 කින් ගෙවා අවසන් කිරීමට නියෝග කර තිබුණි.

(ආ) විනය විරෝධී හැසිරීම් මත සේවයෙන් පහ කර තිබූ පුද්ගලයින් 04 දෙනෙකු විසින් ගුරු පුහුණු සහතික ලබා ගැනීම සම්බන්ධයෙන් ආයතනයට එරෙහිව අධිකරණ වල නඩු 04 ක් ගොනුකර තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ජාතික අධ්‍යාපන ආයතනය පිහිටා තිබූ රජය සතු රු.78,600,000 ක් වටිනා හෙක්ටයාර් 7.0958 ක් වූ තැන්නකැලේවත්ත ඉඩම හා මීපේ ගුරු පුහුණු මධ්‍යස්ථානය පිහිටා තිබූ රු.65,000,000 ක් වටිනා බදුවත්ත (කහටහේන) ඉඩම විධිමත් ලෙස ආයතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම වෙනුවෙන් උපදේශක සමාගමක් සමග ගිවිසුම්ගතව, උපදේශක ගාස්තු ලෙස රු.1,200,949 ක් ගෙවා වසර 7ක් ගතවී ඇතත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. මෙම ගෙවීම ගිණුම් වලින් කපාහැරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර තිබුණි.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ 6 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණි දක්වා පාසල් විෂය ධාරාවට අනුකූල වන පරිදි ගුරුභවතුන් සඳහා ඇගැයීම් උපකරණ ලෙස ග්‍රන්ථ 124,000 ක් මුද්‍රණය කර තිබුණද විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 15 දින වන විටත් විෂයයන් 27 කට අදාල රු.5,873,491 ක් වටිනා ග්‍රන්ථ 81,416 ක් ගුරුභවතුන් අතර බෙදාහැරීමට කටයුතු කර නොතිබිණි.

(ආ) 2009 ඔක්තෝබර් මාසයේදී 6 වන ශ්‍රේණිය සඳහා මුද්‍රණය කරන ලද විෂයයන් 18 කට අදාල ගුරු මාර්ගෝපදේශ 43,979 කින් වටිනාකම රු.6,591,677 ක් වටිනා ගුරු මාර්ගෝපදේශ 36,308 ක් එනම් සියයට 82 ක ප්‍රමාණයක් අවුරුදු 04 ක කාලයක සිට ගුරුවරුන් වෙත බෙදා හැරීමට හෝ අලෙවි කිරීමට කටයුතු නොකර ගබඩා කර තිබුණි. 2015 වර්ෂයේ සිට 6 ශ්‍රේණියේ විෂය නිර්දේශ සංශෝධනය කිරීම හේතුවෙන් මෙම පොත් භාවිතයට ගැනීමක් සිදු නොකෙරෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) ආයතනයේ අවශ්‍යතාවය අනුව පූර්ව ඉල්ලීමකින් තොරව අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ වාචික උපදෙස් මත හදිසි අත්‍යවශ්‍ය මිලදී ගැනීමක් ලෙස සඳහන් කරමින් ඍජු ප්‍රසම්පාදනය යටතේ සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී රු.2,195,200 ක් වැය කර දේශන ශාලා පුටු 400 ක් මිලදී ගෙන විවිධ අංශවලට බෙදාහැර ඇතත් නිසි උපයෝජනයට යොදා ගෙන නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දැනුම කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘති අරමුදල් (TESP) උපයෝගී කරගෙන එහි අරමුණුවලට පටහැනි පහත සඳහන් කාර්යයන් වෙනුවෙන් වැයකර තිබුණි.

(අ) මුදල් අයකර පවත්වනු ලබන විවිධ උපාධි පාඨමාලා සඳහා පිරිනමනු ලබන සහතික පත්‍ර බහාලුම් 8,000 ක් මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී රු.1,315,130 ක් වැය කිරීම.

(ආ) විදුහල්පතිවරු පුහුණු කිරීමේ වැඩසටහනකදී බෙදාහැරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී Pen drive 1,000 ක් මිලදී ගැනීම සඳහා රු.703,800 ක් වැය කිරීම.

**4.4 අරමුදල් ඌණ උපයෝජනය**

පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා 2011 වර්ෂයේ රු. 8,750,000 ක අරමුදලක් වෙන්කර තිබුනද 2015 මාර්තු 31 දින දක්වාම කිසිදු පර්යේෂණ ක්‍රියාවක් සඳහා අරමුදල් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**4.5 හඳුනා ගන්නා ලද පාඩු**

ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන සියළුම විභාග සහතික පත්‍ර සඳහා පොදු සහතිකයක් මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණාලය වෙත ලබාදී තිබූ ඇණවුම අනුව මුද්‍රණය කරන ලද දෝෂ සහිත ආදර්ශකය නිවැරදි බවට ආයතනයේ අධ්‍යක්ෂවරයෙකුගේ අනුමැතිය මත සහතික පත්‍ර 1,450 ක් මුද්‍රණය වෙනුවෙන් රු.85,112 ක් වැයකර තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

2014 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 652 ක්ද තථ්‍ය සේවක සංඛ්‍යාව 462 ක්ද වීමෙන් සේවක පුරප්පාඩු 190 ක් විය. එක් එක් දෙපාර්තමේන්තු සඳහා කාර්යය මණ්ඩල අවශ්‍යතාවය අනුව අවශ්‍ය නිලධාරීන් සංඛ්‍යාව අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අයවැය ලේඛනමය පාලනය**

ආයතනයේ සංශෝධිත අයවැය ලේඛනය ගිණුම් වර්ෂය ඉකුත් වී මාස 04 ක් ගතවීමෙන් පසුව අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව විගණනය වෙත ඉදිරිපත් කරන ලද්දේ 2015 මැයි 08 දිනදීය. සංශෝධිත අයවැය ගත වියදම් තථ්‍ය වියදම් සමඟ සැසඳීමේදී සියයට 24 සිට සියයට 101 දක්වා විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

විගණන නියැදි පරීක්ෂාවේදී 2009 ජූනි 01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 (I) හා 30(II) ප්‍රකාරව ආයතනයේ මාණ්ඩලික ශ්‍රේණි හැර අනෙකුත් නිලධාරින්ගේ වැටුප් පරිවර්තනය කිරීමේදී නිලධාරීන් 29 දෙනෙකු සඳහා 2009 ජනවාරි 01 සිට 2014 අප්‍රේල් 30 දක්වා රු.1,209,220 ක වැටුපක් වැඩිපුර ගෙවා තිබූ අතර ඒ මත රු.156,684 ක සේවක අර්ථ සාධක මුදල් ප්‍රේෂණය කර තිබූ බව ඉකුත් වර්ෂයේ වාර්තාවෙන් පෙන්වාදී තිබුනද එය 2015 ජූනි 22 දින වනවිටත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

**----------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවන ලදි. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) සේවක මණ්ඩල කළමනාකරණය
(ආ) අධ්‍යාපන ප්‍රකාශන බෙදාහැරීම
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) ගිණුම්කරණය
(ඉ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය
(ඊ) තොග පාලනය